# පටිච්චසමුප්පාදය  - සර්වකාලීන පොදු ධර්මතාව

**කථිකාචාර්ය වැලිවිට සොරත හිමි**

ලෝකය හා සත්වයා පිළිබඳ යථා ස්වභාවය, පරම සත්‍යය කුමක්දැයි යන්න සෙවීම සඳහා භාරතීය චින්තකයන් දැඩි ප්‍රයත්නවල යෙදුණු බවට සාදක පෙළ දහමෙන් පෙනේ. බුදුන් පහළ යුයේ මෙවන් පසුබිමක් පැවති යුගයකය. පෙළ දහමට අනුව සත්‍ය ගවේෂණයෙහි යෙදුණු සමකාලීන චින්තකයන් ශ්‍රමණ හා බ්‍රාහ්මණ වශයෙන් දෙයාකාර විය. ඔවුන් අතර මිථ්‍යා දෘෂ්ටික මත දැරූ පිරිස් 62 ක් සිටි බව දීඝනිකායේ බ්‍රහ්මජාල සූත්‍රයෙහි සඳහන් වේ.[1] ඔවුන් ඒ සඳහා ආතප්පමන්වාය (උත්සහ කරමින්) පධානමන්වාය (වීර්ය වඩමින්) අනුයොගමන්වාය (නැවත නැවතත් වීර්ය වඩමින්) සම්මා මනසිකාරමන්වාය (මනාකොට මෙනෙහි කරමින්) සත්වයා හා ලෝකය පිළිබඳ ඇති තතු ගවේෂණයෙහි යෙදී සිටි බව සඳහන් වේ.

වේද හා බ්‍රාහ්මණ යුගවලදී ප්‍රමුඛත්වය ගත් පුදසිරිත්, යාග හෝම සහිත කර්ම මාර්ග ආරණ්‍යක උපනිෂද් යුග වනවිට යටපත් වන්නට විය. එකී පසු යුගවලදී ඉදිරියට පැමිණියේ ඥාණ මාර්ගයයි. ඒ අනුව ඇතැමෙක් වාද විවාද තර්ක විතර්ක කරමින් සත්‍යය සෙවූහ. (සඤ්ඤං ච දිට්ඨිං ච යෙ අග්ගහෙසුං - තෙ ඝට්ටයන්තා විචරන්ති ලොකෙ)[2] ඇතැමෙක් යෝග භාවනා වැනි මාර්ගයන්ට එළඹුණහ. බුදුසමය පෙන්වා දෙන්නේ මෙකී කවර දෘෂ්ටියකටවත් නොපැමිණ (දිට්ඨිං ච අනුපගම්ම)[3] යථාර්ථය දැකීමයි. (දස්සනෙන සම්පන්නෝ)[4] ඉහතින් සඳහන් වූ මෙකී දෘෂ්ටිවාද සියල්ල ප්‍රධාන අන්ත දෙකකට වැටී ද්වයවාදීව පවතින බව ද තමන් වහන්සේ එකී අන්තයන්ට නොපැමිණ මැදහත්ව ධර්මය දේශනා කරන බව ද ප්‍රකාශ කරති.

සබ්බං අත්ථී'ති අයමෙකො අන්තො. සබ්බං නත්ථී'ති දුතියො අන්තො. එතෙ තෙ උභො අන්තෙ අනුපගම්ම මජ්ඣෙන තථාගතො ධම්මං දෙසෙති[5]

(සියල්ල ඇත. (ශාස්වතය) මේ එක් අන්තයකි. සියල්ල නැත. (අශාස්වත) මේ දෙවෙනි අන්තයයි. මෙම අන්ත දෙකට ම නොවැටී මැදිහත් ව ධර්මය දේශනා කරති)

මේ අනුව මෙම අන්ත දෙකට ම නොවැටී යථාර්ථය තේරුම් ගැනීමට උපකාරී වන දාර්ශනික අධ්‍යයන ක්‍රම දෙකක් ආදි බුදු දහමෙහි පෙන්වා දී ඇත. එනම්

1. විශ්ලේෂණ න්‍යාය

2. සංශ්ලේෂණ න්‍යාය

යනුවෙනි. මෙහිදී විශ්ලේෂණ න්‍යාය යනු පුද්ගලයා හා ලෝකය ඛන්ධ ආයතන ධාතු වශයෙන් බෙදා වෙන් කිරීමයි. සංශ්ලේෂණ න්‍යාය යනු එසේ බෙදා වෙන් කළ දේ නැවත එක් කිරීමයි. එය බුදු දහමේ පටිච්චසම්පුපාදය හෙවත් හේතුඵල ධර්මතාව මගින් උගන්වා ඇත් ඒ අනුව මුල් බුදුසමයෙහි ඉගැන්වීම් අතර පටිච්චසමුප්පාදය සුවිශේෂී ස්ථානයක් උසුලනු ලබයි. මෙමගින් පෙන්වා දෙන්නේ ඛන්ධ ආයතන ධාතු ආදි කොටස්වලට බෙදා වෙන් කළ මූල සාදකයන් කිසිවක් තනිව, ස්වාධීනව, හුදකලාව නොපවත්නා බවත් සියල්ල එකිනෙකට සාපේක්‍ෂකව පවත්නා බවත්ය. එසේ සංශ්ලේෂණාත්මක ව පවතින නාමරූප ධර්ම අධ්‍යයනයන කිරීමේදී ද ශාස්වත උච්ඡේද යන උභයන්තය ම බැහැර වෙන බව පෙන්වා දෙයි. ඒ අනුව සියල්ල සාපේක්‍ෂකය. නිරපේක්‍ෂක නොවේ. පරාධීනය. සිවාධීන නොවේ. පර තන්ත්‍රය, ස්වතන්ත්‍ර නොවේ. හෙවත් හේතුඵල වශයෙන් එකිනෙකට උපකාරීව පවති. පටිච්චසමුප්පාදය වටහා ගැනීම බුද්ධ ධර්මය වටහා ගැනීම මය. බුද්ධ ධර්මය වටහා ගැනීම පටිච්ච සමුප්පාදය වටහා ගැනීම ම වේ. (යො පටිච්චසමුප්පාදං පස්සති. සො ධම්මං පස්සති. යො ධම්මං පස්සති. සො පටිච්චසමුප්පාදං පස්සති)[6] මෙයින් බුදුදහම හා පටිච්චසමුප්පාදය එකිනෙකට වෙනස්, වෙන් වෙන්ව පවතින්නක් නොව ඒ දෙකම එකම ප්‍රස්තුතයක් වේ යන්න බුදු දහමේ ඉගැන්වීමයි.මහාවග්ග පාළියේ දැක්වෙන පරිදි උපතිස්ස පරිබ්‍රාජකයා අස්සජි හිමියන්ගෙන් ඔබේ දහම කුමක්දැයි ඇසූ කල්හි ඊට පිළිතුරු දී ඇත්තේ තම දහම නම් පටිච්චසමුප්පාදය හෙවත් හේතුඵල ධර්මය වන බවය.

යෙ ධම්මා හෙතුප්පභවා - තෙසං හෙතු තථාගතො ආහ

තෙසං ච යො නිරොධො - එවං වාදි මහා සමණො[7]

පටිච්චසමුප්පාදය බුදුරදුන් ප්‍රථමාභිසම්බෝධියෙන් පසු අනුලෝම පටිලෝම වශයෙන් මෙනෙහි කොට ඇත. (පටිච්චසමුප්පාදං අනුලොම පටිලොමං මනසාකාසි)[8] එසේ මුල් සතියේ ම මෙනෙහි කරන ලද්දේ එය ම මූලික ඉගැන්වීම වූ නිසාය. එසේ මෙනෙහි කිරීමෙන් පසු උන්වහන්සේට හැඟී ගියේ තණ්හාවෙන් රාගයෙන් මත් වූ යටිගං බලා යන චින්තනයක් ඇති ප්‍රජාවට දහම් දෙසීමෙන් පලක් වේදො නොවේදො යැයි සැකයක් මතු වී ඇත. එසේ නොවැටහෙන ධර්මය අන් කිසිවක් නොව මෙම පටිච්චසමුප්පාදය මය. (ආලයරාමා අයං පජා ආලයරතා ආලය සමුදයො ඉදං පි ඛො ඨානං දුද්දසං යදිදං ඉදප්පච්චයතා පටිච්චසමුප්පාදො)[9]

ධම්මට්ඨිතතා, ධම්මනියාමතා, ඉදප්පච්චයතා, ධම්මතා ආදි වචනවලින් හැඳින්වෙන් මෙම පටිච්චසමුප්පාදය බුදුවරු ලෝකයේ පහළ වුවත් නොවූවත් සර්කාලීනව පවතින්නා වූ පොදු ධර්මතාවයකි. (උප්පාදා වා තථාගථානං අනුප්පාදා වා තථාගථානං ඨිතාව සා ධාතු යදිදිං පටිච්චසමුප්පාදො)[10] මෙම ධර්මයේ අපූර්වත්‍ය නිසා ම බෞද්ධ ඉතිහාසයේ තොරතුර සැපයූ

බොහෝ විද්වතුන්ගේ අවධානය මීට යොමු වී ඇත. පසුකාලීනව බිහි වූ මාධ්‍යමක දර්ශනයේ හෙවත් ශූන්‍යතාවාදයේ ආරම්භකයා සේ සැලකෙන ආචාර්ය නාගර්ජුනපාදයෝ පටිච්ච සමුප්පාදය ශූන්‍යතාවය බවත් එයම මධ්‍යම ප්‍රතිපදාව වන බවත් පෙන්වා දී තිබේ. (යඃ ප්‍රතීත්‍යසමුත්පාදඃ ශූන්‍යතාං තාං ප්‍රචක්‍ෂාමහෙ. සා ප්‍රඥප්තිරුපාදාය ප්‍රතිපත්සෛව මධ්‍යමා)[11] ඒ අනුව පටිච්ච සමුප්පාදය යනු සදාකාලිකව ලොව පවත්නා වූ ධර්මතාවයකි. සැමදා මිනිසුන්ට මුහුණපාන්නට සිදුවන්නේ ඉපදීම පැවැත්ම මරණය වැනි ධර්මතාවයන්ටය. මෙම තත්වය මිනිසුන්ට නොවැටහෙන නිසා එය කියා දීමට බුදුවරු ලෝකයේ පහළ වෙති. මේ තත්වය පිළිබඳ හරිහැටි අවබෝධයක් මිනිසා තුළ නොමැති කමින් අවුල් වූ නූල් පන්දුවක් සේ බුබුස්තණ පඳුරක් අවුල් වියවුල් තත්වයට පත් වී ඉපදෙමින් මැරෙමින් සසර සැරිසරන බව දීඝනිකායේ මහානිදාන සූත්‍රයේදී ආනන්ද හිමියන්ට බුදුරදුන් පෙන්වා දී තිබේ. (එතස්ස ආනන්ද ධම්මස්ස අනනුබොධා අප්පටිවෙධා එවමයං පජා තන්තාකුලකජාතා ගුලාගුණ්ඩිකජාතා මුඤ්ජබබ්බජභූතා අපායං දුග්ගතිං විනාපාතං සංසාරං නාතිවත්තන්ති[12]

පටිච්චසමුප්පාදය පිළිබඳ ව කෙරෙන න්‍යාය අනුව පටිච්චසමුප්පාදය යනු

අස්මිං සති ඉදං හොති - මෙය ඇතිකල මෙය වෙයි

අස්මිං අසති ඉදං න හොති - මෙය නැති කල මෙය නොවෙයා

ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති - මෙය ඉපදීමෙන් මෙය උපදී

ඉමස්ස නිරොධා ඉදං නිරුජ්ඣති - මෙය නැති වීමෙන් මෙය නැති වේ.[13]

යන න්‍යායයට අනුව පටිච්චසමුප්පාදය විග්‍රහ කළ හැකිය. මෙහි ඇත හා නැත වශයෙන් වාක්‍ය යුගල දෙකක් දැකිය හැකිය. පළමු වාක්‍ය දෙකට අනුව යමකට සාපේක්‍ෂකව යමක පැවැත්ම ප්‍රකාශ වෙයි. ඒ අනුව ලෝකයේ ඕනෑම දෙයක් ඕනෑම ක්‍රියාවක් පවතින්නේත් සිදුවන්නේත් එකිනෙකට සාපේක්‍ෂකවය. ස්වාධීන හෝ ස්වතන්ත්‍ර දෙයක් එහි නොමැත. එසේම ඇති හෝ නැත යනුවෙන් ප්‍රකාශ වන්නේ යමක ඇති වීම හෝ නැතිවීමයි. එනම් අනිත්‍යතා සිද්ධාන්තයයි. ස්ථාවර වූ සදාකාලිකව පවතින්නා වූ ලොව කිසිවක් නැත. සැම පුද්ගලයෙක් සැම වස්තුවක් දෙස මෙම න්‍යායට අනුව බැලීමෙන් ඒ පිළිබඳ ව යථාර්ථවාදී විවරණයක් හා අවබෝධයක් මේ තුළින් ලබා ගත හැකිය. ඒ අනුව යම් දෙයක පැවැත්ම ඇත්තේ තවත් දෙයක පැවැත්ම නිසා නම් එයින් එකක් නැතිකල්හි අනික ද අභාවයට යයි. මෙය පටිච්චසමුප්පාද න්‍යායේ ක්‍රමවේදයයි. ඒ අනුව මුල් කාලීන ඇතැම් දාර්ශනිකයන් ඉදිරිපත් කළ ලෝකය මැව්වේ මහා බ්‍රහ්මයයාය ඔහුට අනුව ලෝකයේ සියල්ල පවතින්නේය යන සංකල්පය මෙයින් බැහැර වේ. පටිච්ච සමුප්පාද න්‍යායට අනුව සැම දෙයක ම ඉදිරි ගමන සකස් කර ගැනීමේ වගකීම හා

නිදහස ඇත්තේ පුද්ගලයා විසින් සිදුකරනු ලබන ක්‍රියාවන් අනුවය. ඒ අනුව පටිච්ච සමුප්පාද න්‍යාය යනු ලොව යථා තත්වය අවබෝධ කොටගෙන තමාට අභිමත පරිදි අපේක්ෂිත ඉලක්කයන් කරා ගමන් කිරිමට මග පාදන දහමක් බවය.

පටිච්ච සමුප්පාදයේ මූලික අර්ථය ඉහතින් සඳහන් වූ ඇත නැත යන සංකල්පය වුවත් බුදුරජුන් ප්‍රථමාභිසම්බෝධියෙන් පසුව පටිච්ච සමුප්පාදය අනුලෝම, පටිලෝම හා අනුලෝම පටිලෝම වශයෙන් මෙනෙහි කළ බව සඳහන් වේ. එනම් ද්වත්තිංසාකාර වූ පටිච්චසමුප්පාදයයි.[14]ඒ අනුව ද්වත්තිංසාකාර පටිච්චසමුප්පාදය නම්-඼

අවිජ්ජා - චතුරාර්ය සත්‍යය නොදැනීම

සංඛාරා - ක්ලේශ ධර්ම එක්රැස් කිරීම

විඤ්ඤාණං - විඤ්ඤාණය

නාමරූපං - පඤ්චස්කන්ධය

සළායතනං - ෂඩ් ආයතන

ඵස්සො - ස්පර්ශය

වේදනා - වින්දනය

තණ්හා - තෘෂ්ණාව

උපාදානං - දැඩිව අල්ලා ගැනීම

භවො - වීම

ජාති - ඉපදීම

ජරා, මරණ, සොක, පරිදේව, දුක්ඛ, දෝමනස්ස -

මෙහි සඳහන් වන අන්දමට එකක් නිසා තව එකක් හටගනී. එය නිසා තව එකක් හටගනී. මේ ආකාරයට පුද්ගලයාගේ ඉපදීම ඇති වීමට හේතු වන කාරණා දොළහක් ඉවහල් වේ. ඒ අනුව මනුෂ්‍යයා ජරා ජීර්ණ තත්වයට මරණයට සෝක පරිදේව දුක් දොම්නස් වැනි ක්‍රියාවලියට පත්වීමට හේතු වන්නේ ඉපදීම නිසාය. ඉපදීමට මූලිකම හේතුව වන්නේ භවයක් ලබාගැනීම නිසාය. භවයක් ඇති වන්නේ මේ සියල්ල මමය මාගේය වශයෙන් දැඩිව අල්ලා ගැනීම හේතු කොට ගෙනය. මේ ආකාරයට පුද්ගලයාගේ ක්‍රිකාරීත්වය චතුරාර්ය සත්‍යය පිළිබඳ

ව හරිහැටි අවබෝධයක් නොමැති කම දක්වා එකිනෙකට බලපානු ලබයි. චතුරාර්ය සත්‍යය හරිහැටි අවබෝධ කරගෙන බවුන් වඩන්නේ නම් පුද්ගලයා මෙලොව නැවත නූපදී. මෙම ද්වත්තිංසාකාර පටිච්චසමුප්පාදයේ සඳහන් අවිජ්ජා හා සංඛාර අතීතයටත් ජාති මරණාදිය අනාගතයටත් අනික් සියල්ල වර්තමානයටත් බලපවත්වන බව කිව හැකිය. එහෙත් වෙත්තමුනි මහතා සඳහන් කරන්නේ නිරන්තරයෙන් අනිත්‍යතාවයට පත්වන්නා වූ ලෝකයේ පවත්නා සියල්ල සූක්ෂම අයුරින් සලකා බලන කළ මෙම සංකල්පයට ගත නොහැකි බවය.[15]

ජීවිතය හටගන්නේත් රැඳෙන්නේත් පවතින්නේත් ඉහතින් සඳහන් වූ අන්දමට අවිජ්ජා පච්චයා සංඛාරා ආදී න්‍යාය තුළිනි. මෙය අනෙක් අතට ගත්කළ එය නිවී යන පිළිවෙලක් ද දැකිය හැකිය. එනම් අවද්‍යාව දුරුකිරීමෙන් සංස්කාර දුරු වෙයි. සංස්කාර නැතිවීමෙන් විඤ්ඤාණය දුරු වේ. මේ ආකාරයට එකිනෙක නැති වී ජාතිය දුරු වීමෙන් ජරා මරණ සෝක පරිදේව දුක් දොම්නස් ආදීන්ගේ හටගැන්ම ද දුරු වෙයි. මේ හැම කරුණක් ම ප්‍රත්‍යයක් නිසා හටගත්තේ ද (පටිච්චසමුප්පන්න) හටගැනීමට ප්‍රත්‍ය වන්නේ ද (පටිච්ච සමුප්පාද) වෙයි.[16] එහෙයින් මේ සියල්ල සාපෙක්ෂක ද, එකිනෙකට යටත්ව ද, එකිනෙකට බැඳුනේ ද, වෙයි. එකකුදු පරම හෝ නිදහස් නොවේ. ඒ අනුව මේ පටිච්චසමුප්පාදය චක්‍රයක් මිස වැලක් හැටියට නොගත යුතුය.

මේ ආකාරයට බලන කළ ලෝකයේ සෑම දෙයක් සඳහාම මේ පටිච්ච සමුප්පාද න්‍යාය පදනම් වේ. මහානිදාන සූත්‍රාගත තොරතුරුවලට අනුව පුද්ගලයාට සමාජගත අවුල් වියවුල් හා අසහනය ඇතිවීමට හේතුවන්නා වූ කරුණු කාරණා එකිනෙකට විස්තර කර ඇත. එහි විස්තර කෙරෙන අන්දමට වේදනාව නිසා තණ්හාව ද. තණ්හාව නිසා සෙවීම ද, සෙවීම නිසා ලැබීම ද, ලැබීම නිසා හොඳ නරක විනිශ්චය කිරීම ද, ඒ නිසා විනිශ්චය කළ වස්තුව කෙරෙහි ඇල්ම ද, ඇල්ම නිසා මමය මාගේය යන බලවත් සනිටුහන ද, එම නිසා මසුරුකමද, මසුරුකම නිසා ඒවා ආරක්ෂා කිරීම ද, ආරක්ෂා කිරීම නිසා දඬු මුගුරු ගැනීම, ආයුධ ගැනීම, කලහ කරීම්, විවාද කිරීම්, බැනගැනීම්, කේලම් කීම්, බොරුකීම් ආදී නොයෙක් අකුසල ධර්මයන් හටගන්නා බව පෙන්වා දෙයි. (ඉති ඛො පනෙතං ආනන්ද වෙදනං පටිච්ච තණ්හා, තණ්හං පටිච්ච පරියෙසනා, පරියෙසනං පටිච්ච ලාභො, ලාභං පටිච්ච අජ්ඣොසානං, අජ්ඣොසානං පටිච්ච පරිග්ගහො, පරිග්ගහං පටිච්ච මච්ඡරියං, මච්ඡරියං පටිච්ච ආරක්ඛො, ආරක්ඛාධිකරණං පටිච්ච දණ්ඩාදාන සත්ථාදාන කලහ විග්ගහ විවාද තුවං තුවං පෙසුඤ්ඤ මුසාවාදා අනෙකෙ පාපකා අකුසලා ධම්මා සම්භවන්ති)[17]

දීඝනිකායේ චක්කවත්ති සීහනාද සූත්‍රයේ පටිච්ච සමුප්පාද න්‍යායට අනුව දිළින්දන්ට ධනය නොමැතිකමින් දස අකුසල ධර්මයන් සිදුවන බව පෙන්වා දී තිබේ. දිළින්දන්ට ධනය

නොමැතිකම නිසා දිළිඳු බව වැඩි වී ගියේය. දිළිඳු බව වැඩි වී ගිය පසු සොරකම් කිරීම සිදුවිය. සොරකම නිසා ආයුධ වැඩි වී ගියේය. ආයුධ වැඩිවීම නිසා ප්‍රාණඝාතය වැඩි වී ගියේය. ප්‍රාණඝාතය වැඩි වී ගිය නිසා මුසාවාදය වැඩිවිය. මුසාවාදය වැඩිවීම නිසා කේලාම් වචන වැඩි වී ගියේය. කේලාම් වචන වැඩිවීම නිසා රළු වචන කථා කරන්නට විය. රළු වචන කථා කිරීම නිසා කාමමිථ්‍යාචාරය වැඩි වී ගියේය. කාමමිථ්‍යාචාරය වැඩිවීම නිසා පරුෂ වචනත් හිස් වතනත් කථා කරන්නට විය. ඒ දෙක ම නිසා අභිධ්‍යා ව්‍යාපාද වැඩි වී ගියේය. (ඉති ඛො භික්ඛවේ අධනානං ධනෙ අනනුප්පදියමානෙ දාළිද්දියං වෙපුල්ලමගමාසි. දාළිද්දියෙ වෙපුල්ලං ගතෙ අදින්නාදානං වෙපුල්ලමගමාසි. අදින්නාදානෙ වෙපුල්ලං ගතෙ සත්ථං වෙපුල්මගමාසි. සතේථ වෙපුල්ලං ගතෙ පාණාතිපාතො වෙපුල්ලමගමාසි. පාණාතිපාතෙ වෙපුල්ලං ගතෙ මුසාවාදො වෙපුල්ලමගමාසි. මුසාවාදෙ වෙපුල්ලං ගතෙ පිසුණා වාචා වෙපුල්ලමගමාසි. පිසුණවාචාය වෙපුල්ලං ගතාය කාමෙසු මිච්ඡාචාරා වෙපුල්ලමගමාසි. කාමෙසු මිච්ඡාචාරෙ වෙපුල්ලං ගතෙ ද්වේ ධම්මා වෙපුල්ලමගමංසු ඵරුසා වාචා සම්පප්පලාපො ච. ද්වීසු ධම්මෙසු වෙපුල්ලං ගතෙසු අභිජ්ඣා ව්‍යාපාදො වෙපුල්ලමගමංසු. අභිජ්ඣාව්‍යාපාදෙසු වෙපුල්ලං ගතෙසු මිච්ඡාදිට්ඨි වෙපුල්ලමගමාසි)[18]

මේ ක්‍රමයට සෑම දෙයක් කෙරෙහි ම බලපානු ලබන්නේ පටිච්චසමුප්පාදයයි. යම්කිසි ආයතනයක හෝ මෙම ක්‍රමවේදය පවතින බව පෙන්වා දිය හැකිය. රෝහලක් ගත්විට ලෙඩුන් නිසා දොස්තරවරු සිටිති. දොස්තරවරු නිසා ඔව්නුට ප්‍රතිකාර කිරීමට ස්ථානයක් අවශ්‍යය. ඒ අනුව රෝහල් ඇත්තේ එමනිසාය. රෝහල් පවතින නිසා ඇඳ පුටු තිබේ. ඇඳපුටුවල ලෙඩුන් රැඳේ. මේ ක්‍රමයට අවිද්‍යාව නිසා සංස්කාර, .....ජාති නිසා ජරා මරණ සෝක පරිදේව දුක් දොම්නස් ඇත. මරණින් පසු ඔවුන් නැවතත් සසරට වදින්නේ චතුරාර්ය සත්‍ය අවබෝධ කරගෙන නැති නිසාය. මේ ක්‍රමයට චක්‍රයක් සේ සැමදා පුද්ගලයාගේ සසර ගමන සිදු වේ. මේ ක්‍රමයට රෝහල නැතිවිට ලෙඩ්ඩු නැත. ආදි වශයෙන් යමක් නැති කල්හි එහි පැවැත්මක් ද දැකිය නොහැකිය.

පාසලක්, විශ්වවිද්‍යාලයක් ගත්කළ ද සිසුන් නිසා ගුරුවරු සිටිති. ගුරුවරු නිසා ඔවුන්ට ඉගැන්වීමට ගොඩනැගිලි සෑදේ. ගොඩනැගිලි නිසා මේස පුටු ආදි ඇත. මේස පුටු නිසා ඒ ආරක්ෂා කිරීමට වෙනම පරිපාලනයක් ඇත. පරිපාලනය නිසා සිසුහු බඳවා ගැනෙති. මේ විදියට සෑම දෙයක් ම චක්‍රයක් සේ ක්‍රියාත්මක වේ. මෙහිදී සිසුන් නැති කල්හි ගුරුවරු නොමැත. ආදී වශයෙන් කෙනෙක් නැතිවිට තවත් කෙනෙක් නැති වේ. මෙය ද පටිච්ච සමුප්පාද න්‍යායට අනුව සිදු වන්නකි.

එසේම බීජයක් නිසා ගහක් හටගනී. ගස නිසා කොළ, මල් හටගනී. කොළ මල් නිසා ගෙඩි හටගනී නැවත ගෙඩියෙන් ඵලයක්හටගනී. මේ ආකාරයට ගසක පැවැත්ම ද පටිච්ච සමුප්පාද න්‍යායට අනුව සිදුවන බව පෙන්වා දිය හැකිය. බීජයක් නැති කළ ගසක් හටගන්නේ නැත. (බීජාභාවේ ඵලාභවො) ඒ අනුව පටිච්චසමුප්පාද න්‍යාය ඕනෑම දෙයකට වලංගු වන පෙන්වා දිය හැකිය.

මෙය පටිච්චසමුප්පාදය පිළිබඳ ව කෙරුණු සංක්ෂිප්ත විවරණයකි. පටිච්ච සමුප්පාද ධර්මය පිළිබඳ ව කෙරුණු මෙම විග්‍රහයට අනුව ලෝකයේ පවතින සියල්ලක්ම පාහේ මෙම න්‍යාය ධර්මයට යටපත්ව පවතින්නක් බව පෙන්වා දිය හැකිය. එය සර්වකාලීනව දැකිය හැකි න්‍යාය ධර්මයක් ද වන්නේය. මේ තුළින් ලෝකය හා සත්වයාගේ පැවැත්ම සිදු වන්නේ කෙසේද යන්න අවබෝධ කරගත හැකි වන්නේය. මෙහිදී අවධාරණය කළයුත්තේ මේ සියල්ල චක්‍රාකාරයෙන් පවතින්නක් මිස වැලක ස්වභායෙන් නොපවතින බවය.

ආන්තික සටහන්

[1] දීඝනාකිය, බ්‍රහ්මජාල සුත්තං, බු. ජ. මු. 1962. පි. 4-20
[2] බුද්දකනිකාය, සුත්තනිපාත, බු. ජ. මු. 1962, පි. 75.
[3] බුද්දකනිකාය, සුත්තනිපාත, උරගවග්ග, මෙත්ත සුත්තං, හේ. වි. මු. 1929, පි. 135.
[4] -එම- පි. 135.
[5] දීඝනිකාය, බ්‍රහ්මජාලසුත්තං, බු. ජ. මු. 2005, පි. 75
[6] සංයුත්ත නිකාය, පටිච්චසමුප්පාද සුත්තං, බු. ජ. මු. 2005, පි. 145.
[7] මජ්ඣිම නිකාය පි. 189.
[8] බුද්දක නිකාය, උදානපාළි, පඨම බෝධි සුත්තං, පි. 2
[9] මජ්ඣිම නිකාය, පි. 195.
[10] සංයුත්ත නිකාය 2, බු. ජ. මු. පි. 44.
[11] මූලමාධ්‍යමකකාරිකා, පරිච්ඡේද 24.
[12] දීඝනිකාය, මහානිදාන සුත්තං, නව මුද්‍රණය, බු. ජ. මු. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005 පි. 80.
[13] සංයුත්ත නිකාය II බු. ජ. මු. පිටු 44, 100, 120.
[14] බුද්දක නිකාය, උදාන පාළි
[15] Buddha's teaching, pp 118-125
[16] විසුද්ධිමග්ග, (PTS)පි. 517
[17] දීඝනිකාය, මහානිදාන සුත්තං, නව මුද්‍රණය, බු. ජ. මු. බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, 2005 පි. 86.
[18] දීඝනිකාය, චක්කවත්තිසීහනාද සුත්තං, හේ. වි. මු. 2004, පි. 118.

කථිකාචාර්ය වැලිවිට සොරත හිමි

B.A. (Hons.) M.A.
භාෂා අධ්‍යයන අංශය
අනුරාධපුර බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය